# ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමන්ගේ පනිවුඩය



2008 වසරේ ලෝක ජනාවාස දිනය මොරටුව නගරය මුල්කොට දීප ව්‍යාප්ත වැඩසටහනක් ලෙසින් ක්‍රියාවට නැංවීමට තීරණය කිරීම හෙතුවෙන් ඉතා දීර්ඝ කාලයක සිට අවශ්‍යව පැවති මොරටුව නගරයේ ඒකාබද්ධ සංවර්ධන වැඩපිළිවෙල දියත්කිරීමේ හැකියාව ලැබී තිබේ.

මෙවන් වු ජාත්‍යන්තර වැදගත් දිනයක් මොරටුව නගරයේ ජනතාවගේ සහජීවනය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට තීරණය කිරීම පිළිබඳ නිවාස හා පොදු පහසුකම් ඇමතිනි ගරු ෆේරියල් අෂ්රොෆ් මැතිණියටත් , නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ටත් අපගේ කෘතවේදීත්වය මෙයින් පිරිනැමේ.

මෙම ජනාවාස දිනය නිමිතිකොට පසුගිය මාස කිහිපය තුළ දී මොරටුව නගරයේ ක්‍රියාවට නැංවෙන ජනාවාස හා යටිතල පහසුකම් සංවර්ධන වැඩපිළිවෙලවල් රැසක් සැලසුම් වු අතර, දැන් එහි ප්‍රතිලාභ මොරටුව ජනතාවට හිමිවෙමින් පවතී.

දිවයිනේ ප්‍රධානතම නිවාස ව්‍යාපෘතියක් වන සොයිසපුර මහල් නිවාස ව්‍යාපෘතියේ පිළිසකර කටයුතු සිදුකිරීමටත් මොරටුව නගරය හා යාබද ප්‍රදේශයේ නිවාස ව්‍යාපෘති රැසක පිළිසකර කටයුතු මෙම වැඩපිලිවෙල තුළින් ක්‍රියාත්මක වේ. මෙයට අමතරව මොරටුව ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ප්‍රමුඛතම සංවර්ධන ව්‍යාපෘතියක් වන **" ලුනාව පරිසර සංවර්ධන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය"** යටතේ සංවර්ධනය කෙරුනු ප්‍රජාශාලා ළමා ක්‍රීඩාංගනය, මාතෘ සායනය ගොඩනැගිලි ජනතාවගේ අයිතියට පත්කරලීම මෙම කාල පරිච්ඡේදය තුළදී සිදුකෙරේ. එමෙන්ම මොරටුව විශ්ව විද්‍යාලය විසින් මොරටුව මහ නගර සභාව වෙනුවෙන් නිර්මාණය කරන ලද නවතම වෙබ් අඩවිය දියත් කිරීම ද මෙහිදී සිදුකරන ලදී.

මේ සියළු ක්‍රියාකාරකම් හේතුවෙන් මොරටුව නාගරික බල ප්‍රදේශය තුළ කෙටි කාල පරිච්ඡේදයක දී විවිධ වු සංවර්ධන කටයුතු රැසක් නිමකිරීමට හැකිවී තිබේ. මෙම ක්‍රියාදාමය ඉෂ්ඨ කිරීම වෙනුවෙන් ගරු නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමිය සහ නාගරින සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යතුමන්ගේ මඟ පෙන්වීම යටතේ මොටුව නගරාධිපති ඩබ්ලිව් සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමන්ගේ දායකත්වයෙන් සිදුකරන ලද මෙහෙවරට මාගේ කෘතවේදිත්වය පුදකරන අතර, එම කාර්යයට සහාය වූ සැමට ද මාගේ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.

**ජීවන් කුමාරණතුංග**
**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය**